# ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ කේන්ද්‍රස්ථානය සමඟ එක්වීමට ඔබටත් අනගි අවස්ථාවක්



**ශ්‍රී ලංකා මහ බැංකුව**
**இலங்கை மத்திய வங்கி**
**CENTRAL BANK OF SRI LANKA**

රටේ ආර්ථික හා මිල ස්ථායිතාවය පවත්වා ගැනීම සහ මූල්‍ය පද්ධතිය කළමනාකරණය කිරීම තුළින් රටේ සම්පත් වලින් දැයට උපරිම ඵල නෙලා ගත හැකි අන්දමින් ආර්ථිකය කළමනාකරණය කිරීම උදෙසාත්, රජයට අවශ්‍ය වෘත්තීමය උපදෙස් ලබාදීමත් අරමුණු කරගනිමින් 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ වර්ෂ 1950 දී ශ්‍රී ලංකා මහ බැංකුව ස්ථාපිත කරන ලදී.

අපගේ ඉදිරි දැක්ම වනුයේ ශ්‍රී ලංකාවේ සෞභාග්‍යයට දායක වන විශ්වාසනීය වූත්, කාර්යශීලී වූත් ආයතනයක් බවට පත්වීමය. අපගේ මූලික මෙහෙවර වනුයේ ප්‍රතිපත්තිමය උත්තේජක, උපදෙස්, කැපවීම සහ විශිෂ්ටත්වය තුළින් තිරසාර වර්ධනයක් ලබා ගැනීම සඳහා පිටිවහලක් වීමට ආර්ථික සහ මිල ස්ථායිතාවයත්, මූල්‍ය පද්ධතියෙහි ස්ථායිතාවයත් පවත්වාගෙන යාමයි.

එහිදී අප විසින් කාර්යශීලී මග පෙන්වීමක් වෙනුවෙන් වූ කැපවීම, විනිවිදභාවය, වගවීම, අවංකභාවය, වෘත්තීයමය දක්ෂතාවය වෙනුවෙන් කැපවීම, ඉගෙනීම, දැනුම හුවමාරුව, නවතාවයන් සොයා යාම, නිරවද්‍යතාවය, කාර්යය නිදහස, ප්‍රතිඵලය වෙනුවෙන් වන නිරන්තර කැපවීම සහ සහයෝගයෙන් කටයුතු කිරීම යන ගුණාංගයන් පවත්වා ගනී.

**උද්‍යෝගිමත්, නායකත්ව ගුණාංගවලින් යුතු සහ කණ්ඩායම් හැඟීමෙන් වැඩ කිරීමේ හැකියාව ඇති යොවුන් ශාස්ත්‍රඥයන් සහ වෘත්තිකයන් හට**

## කළමනාකරණ අභ්‍යාසලාභීන්

ලෙස

**(මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියට මාණ්ඩලික නිලධාරීන් ලෙස ඇතුළත් කර ගැනීම සඳහා ඉලක්ක කර ඇති)**

ශ්‍රී ලංකා මහ බැංකුවට එක්වන ලෙස ආරාධනා කරයි.

**පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්හට ඉහත තනතුර සඳහා අයදුම් කළ හැකිය.**

### 1. සුදුසුකම් නිර්ණායක

**1.1 අවශ්‍ය අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම්:**

**අ.** ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලැබූ අවම වශයෙන් දෙවන පංතිය ඉහළ පෙළ සාමාර්ථයක් (2nd Upper) හෝ ශ්‍රේණි ලකුණුවල සාමාන්‍යය (GPA) උපරිම 4.0 කින් අවම වශයෙන් 3.5 ක් හෝ බර තැබූ සාමාන්‍යය ලකුණු (WAM) අවම වශයෙන් 75% ක් සහිත, පහත සඳහන් විෂය ධාරාවන්ගෙන් එකක් සඳහා ලබා ගත් විශේෂ උපාධියක් (පාඨමාලා කාලය අවම වශයෙන් වසර 03 ක් විය යුතුය.)

- ආර්ථික විද්‍යාව/කෘෂි ආර්ථික විද්‍යාව
- සංඛ්‍යානය/ගණිතය
- ගණකාධිකරණය/බැංකුකරණය/මූල්‍යය
- ඉංජිනේරු විද්‍යාව
- වාණිජ්‍ය/කළමනාකරණය
- පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය
- රාජ්‍ය/ව්‍යාපාර පරිපාලනය

**හෝ**

**ආ.** ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලැබූ, ඉහත සඳහන් විෂය ධාරාවන්ගෙන් එකක් සඳහා ලබා ගත් පාඨමාලා කාලය අවම වශයෙන් වසර 03 ක විශේෂවේදී උපාධියක් **සමග** පහත දැක්වෙන සුදුසුකම් අතරින් එක් සුදුසුකමක්

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලැබූ, ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය හෝ පරිගණක විද්‍යාව සඳහා ලබා ගත් විද්‍යාපති/ශාස්ත්‍රපති උපාධියක් හෝ ඊට ඉහළ මට්ටමක පශ්චාත් උපාධියක් (පාඨමාලා කාලය අවම වශයෙන් වසර 01 ක් විය යුතුය.)
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (CA-Sri Lanka) ආශ්‍රිත සාමාජිකයෙක් වීම
- එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ වරලත් ආයතනයේ (CIMA-UK) ආශ්‍රිත සාමාජිකයෙක් වීම
- වරලත් සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ (ACCA) ආශ්‍රිත සාමාජිකයෙක් වීම
- ඇමරිකා එක්සත් ජනපදයේ CFA ආයතනයේ වරලත් මූල්‍ය විශ්ලේෂකයෙක් වීම (Charter Holder of CFA)
- ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (CMA-SL) ආශ්‍රිත සාමාජිකයෙක් වීම
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL) ආශ්‍රිත සාමාජිකයෙක් වීම

**උපාධි පාඨමාලාවට අදාළ ප්‍රතිඵල ලේඛනයේ (Degree Transcript) සහ වෘත්තීය සුදුසුකම්වලට අදාළ සහතිකවල ස්කෑන් කරන ලද (Scanned) පිටපත් උඩුගත (Upload) කිරීමට අයදුම්කරුවන් වග බලා ගත යුතුය. අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම්වලට අදාළ ඉහත සඳහන් සහතිකවල පිටපත් උඩුගත (Upload) කර නොමැති අයදුම්පත් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවකදී කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**1.2 වයස: 2019 ඔක්තෝබර් 15** වන දිනට අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

**1.3 තෝරා ගැනීමේ පිළිවෙල:**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන තරග විභාගයකින් අනතුරුව පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණ එකක් හෝ කිහිපයක් මගින්

අයදුම්කරුවන් තරග විභාගයේදී ප්‍රශ්න පත්‍ර තුනකට (සාමාන්‍ය බුද්ධිය, විශ්ලේෂණාත්මක ලිවීම සහ සාමාන්‍ය දැනීම) පිළිතුරු සැපයිය යුතුය.

### 2. තනතුර සඳහා අදාළ වන නීතිරීති සහ රෙගුලාසි

පුහුණු කාලය වසරක් වන අතර එම කාලය තුළ සියලු දීමනා ඇතුළත්ව මසකට රු.75,000/- ක ස්ථාවර දීමනාවක් ගෙවනු ලැබේ.

පුහුණු කාලය සාර්ථකව නිම කරන කළමනාකරණ අභ්‍යාසලාභීන් මාණ්ඩලික පංතියේ 1 ශ්‍රේණියේ පරිවාස මාණ්ඩලික නිලධාරීන් ලෙස අන්තර්ග්‍රහණය කිරීමට සලකා බලනු ලැබේ. වසරක පරිවාස කාලය සාර්ථකව නිම කිරීමෙන් අනතුරුව එම නිලධාරීන්, අන්තර්ග්‍රහණය කල දිනයේ සිට මහ බැංකුවේ ස්ථිර සේවයේ මාණ්ඩලික පංතියේ 1 ශ්‍රේණියෙහි ස්ථිර කිරීම සඳහා සලකා බලනු ඇත.

මාණ්ඩලික පංතියේ 1 ශ්‍රේණියේ නිලධාරීන් ආකර්ෂණීය වැටුපක් සමග මාස දෙකක වැටුපට සමාන වාර්ෂික විශේෂ දීමනාවක්, විශ්‍රාම වැටුප්, අර්ථසාධක අරමුදල් සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ප්‍රතිලාභ, වෛද්‍ය ප්‍රතිලාභ, සේවක ණය පහසුකම් හා පුහුණුවීම් අවස්ථා සඳහා හිමිකම් ලබනු ඇත.

කළමනාකරණ අභ්‍යාසලාභීන් කළමණාකාරීත්වයේ උපදෙස් පරිදි දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කළ යුතු වේ.

### අයදුම් කිරීමේ පිළිවෙළ

**මෙම තනතුර සඳහා අයදුම් කිරීමට බලාපොරොත්තු වන අදාළ සුදුසුකම් සපුරා ඇති තැනැත්තන් 2019 ඔක්තෝබර් 15 දිනට පෙර පහත සඳහන් වෙබ් සබැඳිය (Web Link) ඔස්සේ පමණක් අයදුම් කළ යුතුය.**

**https://www.cbsl.gov.lk/en/careers**

ඉහත වෙබ් සබැඳියේ (Web Link) සඳහන් වන අදාළ නීති රීති හා කොන්දේසි අනුව අයදුම් කිරීමට අයදුම්කරුවන් වග බලා ගත යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අපේක්ෂිත සුදුසුකම් සම්පූර්ණ කර නොමැති තැනැත්තන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබන අතර අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයේ දී අදාළ සහතිකපත්‍රවල මුල්පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් කවර හේතුවක් යටතේ හෝ මෙම තනතුර සඳහා පත් කර ගනු නොලබයි.

තෝරා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම බඳවා ගැනීම සඳහා නුසුදුසුකමක් වේ.

බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීම, බඳවා ගැනීම කල් දැමීම හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය.

ලබා ගත් අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්වලට අදාළව හදාරන ලද විෂයයන්ගේ අදාළත්වය මත අයදුම්පත් තෝරා ගැනීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය.


**අධ්‍යක්ෂ-මානව සම්පත්**
**ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01**
**දුරකථන : 0112477330 ෆැක්ස් : 0112477715**



Apply online Source: www.cbsl.gov.lk (2019.09.15)